ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය -I | කාලය :පැය 01 යි. |
|---|---|---|

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

. බෝසතාණන් වහන්සේ දේවාරාධනාවෙන් පසුව තම අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම හඳුන්වනු ලබන්නේ

I පංච මහා සප්න දැකීම නමිනි
II පංච මහා විලෝකනය නමිනි
III සමතිංසත් පෙරුම් පිරීම නමිනි
IV චතුරංග සමන්නාගත වීර්ය වැඩීම නමිනි

2. සම්මා සම්බුද්ධත්වය සඳහා පෙරුම් පුරණ බෝධිසත්වයන් වහන්සේලා පාරමිතා ධර්මයන් තුන් ආකාරයකින් සම්පූර්ණ කිරීමෙන් පාරමිතා ධර්ම තිහක් බවට පත්වේ. එම තුන් ආකාරය වන්නේ

I සීල, සමාධි, ප්‍රඥා
II දාන සීල භාවනා
III බුදු, පසේ බුදු, මහරහත්
IV පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී

බුදුරදුන් තමන් වහන්සේ දෙවියෙක්, ගාන්ධර්වයෙක්, යක්ෂයෙක් හෝ මනුෂ්‍යයෙක් නොවන බවත් බුද්ධ නම් වන බවත් දේශනා කරනු ලැබුවේ

I සොත්ථිය බමුණාටය
II භාරද්වාජ බමුණාටය
III ද්‍රෝණ බමුණාටය
IV හුහුංක බමුණාටය

බෝසතාණන් වහන්සේ දාන පරමත්ථ පාරමිතාව පූර්ණය කළ බව හෙළිවන ජාතක කතාව වන්නේ

I සිවි ජාතකයයි
II වෙස්සන්තර ජාතකයයි
III මඛාදේව ජාතකයයි
IV යස ජාතකයයි

උස් හඬින් කතා කළහොත් බුදුන් වහන්සේ තම අසපුවට වැඩම නොකරාවි යැයි කියා තම සිසුන් නිශ්ශබ්ද කරනු ලැබුවේ

I සංජය පිරිවැජියා විසිනි
II සෝණ දණ්ඩ බමුණා විසිනි
III උපක ආජීවකයා විසිනි
IV පොට්ඨපාද පිරිවැජියා විසිනි

"සත්හට වන භව දුකට වෙදාණන්" යන ලෝ වැඩ සඟරා කවි පදයට අනුව බුදුරජාණන් වහන්සේ

I සත්වයාගේ කායික දුක්වලට උතුම් වෛද්‍යවරයෙක් වන සේක.
II සසර දුකට ප්‍රතිකාර කරන උතුම් වෛද්‍යවරයෙකු වන සේක.
III උසස් ශල්‍ය වෛද්‍යවරයෙකු වන සේක.
IV සත්වයාට වන ඕනෑම ලෙඩ දුක්වලට ප්‍රතිකාර කළ උතුම් වෛද්‍යවරයෙකු වන සේක

7. බුදුරජාණන් වහන්සේ විසින් [illegible] දෙශනා කලේ කිනම් භික්ෂූන් වහන්සේ අරභයාද?

I ගිරිමානන්ද තෙරුන්
II ආනන්ද තෙරුන්
III කාශ්‍යප තෙරුන්
IV මහා මුගලන් තෙරුන්

8. සිල් රැකීමෙන් ලැබෙන ආනිශංස ගණයට අයත් නොවන කරුණ වන්නේ මින් කුමක්ද?

I කීර්තිය පැතිරීම
II මරණින් මතු සුගතියෙහි උපත ලැබීම
III සිහි මුලාවී කලුරිය කිරීම
IV ඕනෑම පිරිසක් මැදට නිර්භයව ඉදිරිපත්වීමට හැකි

9. සිතෙහි කයෙහි නිදිමත ගතිය, උදාසීනකම පවති නම් පාඩම් කළ දෙය මතකයට නොඑයි. ඒ නිදිමත බව හා උදාසීනකම හැඳින්වෙන්නේ

I විචිකිච්චා නම්නි
II ථිනමිද්ධ නම්නි
III ව්‍යාපාද නම්නි
IV කාමච්ඡන්ද නම්නි

10. ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කරගන්නා වූ පැහැදීම හඳුන්වනුයේ

I අවෙච්චප්පසාදය නම්නි
II අමූලිකා ශ්‍රද්ධාව නම්නි
III තුන්තරා බෝධිය නම්නි
IV භක්තිය නම්නි

11. ලෝකයා, සත්ත්වයා යැයි කියනු ලබන ස්කන්ධ ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැන හැඳින කරනු ලබන භාවනාව වන්නේ

I පිළිකුල් භාවනාව නම්නි
II ආනාපානසති භාවනාව නම්නි
III සමථ භාවනාව නම්නි
IV විපස්සනා භාවනාව නම්නි

2. සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵලයක් නොවන්නේ පිළිවෙලින්

I මතක ශක්තිය දියුණු වීම
II ත්‍රිලක්ෂණයට අනුව ලෝකය දෙස බැලීම
III යමක් ඉදිරිපත් කිරීමට හැකි වීම
IV මනා අවබෝධ කර ගැනීමේ ශක්තිය දියුණු වීම

3. "වෛර කරන්නාවූන් අතර අපි අවෛරීව සුවසේ වාසය කරමු." මෙම අදහස ඇතුළත් වන ධර්ම පද ගාථාවේ මුල් පද දෙක වන්නේ මින් කුමක්ද ?

I "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති"
II "සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ"
III "තංච කම්මං කතං සාධු - යං කත්වා නානු කප්පති"
IV "නහීවේරේන වේරානි - සම්මත්තීධ කුදාචනං"

4. ගිහි විනය සේ සැලකෙන සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි භාර්යාවගෙන් තම ස්වාමිපුරුෂයාට ඉටුවිය යුතු යුතුකම් අතරට අයත් නොවන කරුණ වන්නේ

I උපයන ධනය මැනවින් ආරක්ෂා කිරීම
II ගෙදරදොර කටයුතු මැනවින් සංවිධානය කිරීම
III ඇඳුම් පැළඳුම් සපයා දීම
IV ඇසුරු කරන පිරිවර ජනයාට සංග්‍රහ කිරීම



CamScanner

15. බෞද්ධ ඉගැන්වීම්වල එන පංච බලි සංකල්පයේ "අතිථිබලි" යන්නෙහි අර්ථය වන්නේ

I ආගන්තුකයන්ට සංග්‍රහ කිරීම

II ඥාතීන්ට සංග්‍රහ කිරීම

III මියගිය ඥාතීන්ට පින්දීම

IV රජයට ගෙවිය යුතු බදු ගෙවීම

16. ප්‍රතිසන්ධිය ලබාදීමට ඉවහල් වන කර්මය වන්නේ

I උපත්ථම්බක කර්මය

II උපපීඩක කර්මය

III උපඝාතක කර්මය

IV ජනක කර්මය

17. දුගී දුප්පත් පවුල්වක උපත ලැබුවද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාවිය හැක්කේ

I ගති සම්පත්තියෙනි

II පයෝග සම්පත්තියෙනි

III කාල සම්පත්තියෙනි

IV උපධි සම්පත්තියෙනි

18. "නැවත සසරට එකතු නොවීම නිසා උපතක් සිදු නොවේ" යන්න සඳහන් වන පටිලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ

I උපාදාන නිරෝධා භව නිරෝධෝ යන්නයි

II භව නිරෝධා ජාති යන්නයි

III තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ යන්නයි

IV වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ යන්නයි

19. ධාර්මිකව උපයාගත් ධනයක් ඇතැයි සිතා යමෙක් සතුටක් ලබන්නේ නම් එය

I අත්ථි සුඛ නම් වේ

II අණන සුඛ නම් වේ

III භෝග සුඛ නම් වේ

IV අනවජ්ජ සුඛ නම් වේ

20. බුදුන් වහන්සේ දහවන වස් කාලය ගත කළේ

I බරණැස ඉසිපතනාරාමයෙහිය

II පාරිලෙය්‍ය වනයෙහිය

III සැවැත් නුවර වේළුවනාරාමයෙහිය

IV විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහිය

21. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය" මෙම සටන් පාඨය පෙරදැරි කරගෙන කටයුතු කළ පාලකයා කවුද?

I වළගම්බා මහ රජතුමා

II ධාතුසේන මහ රජතුමා

III මහා පරාක්‍රමබාහු රජතුමා

IV දුටුගැමුණු මහා රජතුමා

22. බුදුන් වහන්සේ සුභ මානවයාට දේශනා කළ පරිදි යමෙකු දුර්වර්ණව උපත ලැබීම සඳහා ඉවහල් වන ක්‍රි[ියාව] වන්නේ

I ප්‍රාණඝාතයේ නිරතවීම

II තමා සතු කිසිවක් අන් අයට නොදීම

III ද්වේශයෙන් යුතුව කටයුතු කිරීම

IV අන් සැපතට ඊර්ෂ්‍යා කිරීම

23. බුදුරදුන්ගේ ප්‍රථම උදාන වැකියෙන් දුක් සහිත පංචස්කන්ධය නැමැති ගෘහය නිර්මාණය කරන අදෘශ්‍යමා[න] බලවේගය ලෙස හඳුන්වා ඇත්තේ

I තෘෂ්ණාවයි

II වේදනාවයි

III අවිද්‍යාවයි

IV විඤ්ඤාණයයි

CamScanner

24. ගිහියෙකු විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපදා මාර්ගය ගෘහස්ථ සීලය නම් වන අතර එයින් ගිහියාගේ නිත්‍ය සීලය ලෙස හැඳින්වෙන්නේ

I අෂ්ටාංගසීලයයි

II පංච සීලයයි

III දස සීලයයි

IV ආජීව අෂ්ඨමක සීලයයි

25. ආර්ය අෂ්ඨාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට [illegible] දී සීලය යටතට අයත් මාර්ග අංග ඇතුලත් වර්ණය මින් කුමක්ද?

I සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම

II සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා

III සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

IV සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි

26. පහත සඳහන් සූත්‍ර අතුරින් කුසලා කුසල කර්ම හා විපාක පිළිබඳ මැනවින් විස්තර කර දෙන සූත්‍ර ධර්මය වන්නේ

I පරාභව සූත්‍රය

II අනත්ත ලක්ඛණ සූත්‍රය

III චුල්ල කම්ම විභංග සූත්‍රය

IV මහා මංගල සූත්‍රය

27. දෙවන ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළේ කවුද

I මහා කාශ්‍යප මහරහතන් වහන්සේ

II උපාලි මහ රහතන් වහන්සේ

III සබ්බකාමී මහ රහතන් වහන්සේ

IV මහා දේව මහ රහතන් වහන්සේ

28. ඒ ඒ ධර්ම කොටස් මුඛ පරම්පරාවෙන් රැගෙන ඉදිරියට ගෙන ඒම සඳහා භාණක පරම්පරාවට භාරදුනි. ඒ අනුව මජ්ඣිම නිකාය භාර දෙනු ලැබුවේ

I සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවටය

II අනුරුද්ධ තෙරුන්ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවටය

III ආනන්ද තෙරුන්ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවටය

IV මහා කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යයානු ශිෂ්‍ය පරම්පරාවටය

29. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් සැළකිය හැකි කරුණක් නොවන්නේ

I රාජ්‍ය පාලනය භික්ෂූන් යටතට ගැනීමය.

II දේශීය භික්ෂු ශාසනය ආරම්භ කිරීමය.

III මහා විහාරය කේන්ද්‍ර කරගත් අධ්‍යාපනයක් බිහිවීමය.

IV කැටයම් හා මූර්ති කලාවක් බිහිවීමය.

30. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලියැ වුණේ

I අනුරාධපුර යුගයේදීය

II කුරුණෑගල යුගයේදීය

III පොළොන්නරු යුගයේදීය

IV දඹදෙණි යුගයේදීය

31. "සම්බුදු සසුන බේරාගැනීම සඳහා තමන් විසිපස් වතාවක්වත් මේ දඹදිව ඉපදේවා" යැයි ප්‍රාර්ථනා කළේ

I මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ය

II අනගාරික ධර්මපාලතුමාය

III හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාය

IV රේරුකානේ චන්දවිමල නාහිමියන්

32. දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන්ම දිගහැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කරන මුද්‍රාව හඳුන්වන නම කුමක්ද 02172

I ධ්‍යාන මුද්‍රාව
II අභය මුද්‍රාව
III විතර්ක මුද්‍රාව
IV ධර්ම චක්‍ර මුද්‍රාව

33. බෞද්ධ ධර්ම සන්නිවේදනයෙහිලා භාවිත ප්‍රධාන මාධ්‍යයක් ලෙස චිත්‍ර කලාව යුග කිහිපයක් ඔස්සේ අනන්‍ය වූ ලක්ෂණ සහිතව සන්නිවේදනය විය. එහිලා අනුරාධපුර යුගයට අයත් පැරණි සිතුවම් විද්‍යමාන වන ස්ථාන දෙකක් වන්නේ

I සීගිරිය හා හිඳගල
II හිඳගල හා දිඹුලාගල
III මහියංගනය හා සීගිරිය
IV දිඹුලාගල හා මහියංගනය

34. පාලි භාෂාව නොදත් සාමාන්‍ය ජනතාවට උපදෙස සැපයීම සඳහා වීදාගම මෛත්‍රී හිමියන් විසින් රචිත කවි බණ පොත වන්නේ

I ලෝකෝපකාරය
II සුභාෂිතය
III කාව්‍යසේඛරය
IV ලෝවැඩ සංගරාව

35. ගර්භයේ හැඩය අනුව නෙල්ලි ගෙඩියක ස්වරූපයෙන් ගොඩ නංවන ලද ස්තූපය හැඳින්වෙන්නේ

I ඝණ්ඨාකාර ස්තූප ලෙසයි
II පද්මාකාර ස්තූප ලෙසයි
III ඝඨාකාර ස්තූප ලෙසයි
IV ආම්ලාකාර ස්තූප ලෙසයි

36. ස්තූපයේ ආරක්ෂාවට ඉදිකරන ලද පියස්සක් සහිත ගෘහය හඳුන්වන්නේ

I පටිමාඝරය ලෙසයි
II බෝධිඝරය ලෙසයි
III චෛත්‍යඝරය ලෙසයි
IV පධානඝරය ලෙසයි

37. මහණෙනි, දුප්පතුන්ට ධනය නුපදනා කළ දිළිඳුකම වැඩිවේ යනාදී වශයෙන් හේතුඵල දහම අනුව සමාජ ගැටලු ඇතිවන ආකාරය පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍ර ධර්මය වන්නේ

I සාමඤ්ඤ ඵල සූත්‍රය
II චක්කවත්ති සීහනාද සූත්‍රය
III බ්‍රාහ්මජාල සූත්‍රය
IV කසීභාරද්වාද සූත්‍රය

38. සප්ත අපරිහාණිය ධර්මයන්ට ඇතුළත් නොවන කරුණ වන්නේ

I දිළින්දන්ට ධනය දීම
II වැඩිහිටියන්ට හා ඔවුන්ගේ අදහස් වලට ගරු කිරීම
III කාන්තාවන්ට ආරක්ෂාව සැපයීම
IV තම රාජ්‍යයට පැමිණෙන පූජනීය උතුමන්ට පහසුකම් සැලසීම

39. පාලකයෙකු තම රටේ වැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය, සුවපහසුව කැප කිරීම දස රාජ ධර්මව වල හැඳින්වෙන්නේ

I පරිත්‍යාගය ලෙසයි
II අවිරෝධතාව ලෙසයි
III දානය ලෙසයි
IV සීලය ලෙසයි

40. රාජ්‍ය පාලකයෙකු සම්බන්ධව කටයුතු කිරීමේදී "යුක්තිය" "අයුක්තිය" "හොඳ" "නරක" තෝරා බේරා ගැනීමට නොහැකිව මුළාවී අගතිගාමී වීම හඳුන්වන්නේ

I ඡන්දය ලෙසයි
II ද්වේෂය ලෙසයි
III භය ලෙසයි
IV මෝහය ලෙසයි

CamScanner

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education
පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - II | කාලය :පැය 02 යි. |
|---|---|---|

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.

- පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න
- පළමු වැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් ද හිමිවේ.

1. I "මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති" යනුවෙන් නිබ්බුත පද පවසනු ලැබුවේ කවුරුන් විසින්ද?

II බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

III "ඉමස්මිං සති ඉදං හෝති ඉමස්මිං අසති ඉදං න හෝති" මෙම පාඨයේ අදහස ලියන්න.

IV සතර අගති නම් කරන්න.

V බුදු දහමේ එන "අණන සුඛය" යන්න කෙටියෙන් හඳුන්වන්න.

VI බුදුරදුන් වජ්ජි රජදරුවන්ට හඳුන්වා දුන් රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය කුමක්ද?

VII බුද්ධ ප්‍රතිමා ප්‍රධාන වශයෙන් වර්ග තුනකට බෙදා දක්වනු ලැබේ. ඉන් දෙකක් නම් කරන්න.

VIII බුදුරජාණන් වහන්සේගේ "පුරිස ධම්ම සාරථී ගුණය" පාදක කොටගෙන රචනා කළ ගද්‍ය කෘතිය හා එහි රචකයා නම් කරන්න.

IX බුදු දහමේ ඉගැන්වෙන සිරිත් විරිත් යන්නෙහි අදහස පහදන්න.

X බුදු දහමේ ඉගැන්වෙන ත්‍රිවිධ තණ්හා නම් කරන්න.

2. I "ගිහි විනය" සේ සැලකෙන සිඟාලෝවාද සූත්‍රයේ දී බටහිර හා උතුරු දිශාවන්ට උපමා කරනු ලැබුවේ කවුරුන්ද?

II ඉන් ඔබ කැමති එක් සමාජ කණ්ඩායමක් මගින් ඉටුවිය යුතු යුතුකම් තුනක් දක්වන්න.

III බෞද්ධ ඉගැන්වීම අනුව අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකිරීමෙන් සමස්ත සමාජයේම දියුණුව ඇතිවන ආකාරය පෙන්වා දෙන්න.

3. I යමක් කිරීමෙන් පසුතැවෙන්නට සිදු වේද යන අදහස අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාව ලියන්න.

II එම ගාථාවෙහි අදහස පහදන්න.

III බෞද්ධයාගේ අත්පොත සේ සැලකෙන උපදේශාත්මක ග්‍රන්ථය සමස්ත මානව වර්ගයාටම පරිහරණය කළ හැකි ග්‍රන්ථයකි. උදාහරණ සහිතව පහදන්න.

4. I විපාක දෙන කාලය අනුව කර්මය සතර ආකාරය. ඉන් දෙකක් නම් කරන්න.

II ඉන් එක් කරුණක් පිළිබඳ පැහැදිලි කරන්න.

III කුසලා කුසල කර්ම පිළිබඳ අවබෝධය ඇති විට මෙලොව පරලොව ජීවිත සාර්ථක කර ගත හැකි ආකාරය ගෙනහැර දක්වන්න.

CamScanner

5. I තෙවෙනි ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු සැකෙවින් දක්වන්න.

II තෙවැනි ධර්ම සංගායනාවේ දායකත්වය, මූලිකත්වය හා පැවැත්වූ ස්ථානය පිළිවෙලින් නම් කරන්න.

III තෙවැනි සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස දේශ දේශාන්තරවල බුදුදහමේ පණිවිඩය ව්‍යාප්තිය සඳහා ඉවහල් වූ ආකාරය ගෙනහැර දක්වන්න.

6. I බෞද්ධ හේතුඵල දහම පිළිබඳ ඉගැන්වෙන කෙටි සූත්‍ර දේශනාව කුමක්ද?

II එහි අදහස පැහැදිලි කරන්න.

III අපේ ජීවිතයේ සාර්ථකත්වයට හා අසාර්ථකත්වයට හේතුව දේව කැමැත්ත හෝ පෙර කරන ලද කර්මය ද නොවේ. ජය හෝ පරාජය අහේතුකව ද සිදු නොවේ. මේ කියමන හේතුඵල දහම පදනම් කරගෙන පැහැදිලි කරන්න.

7. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I චතුරාර්ය සත්‍යය

II රේරුකානේ චන්ද්‍රවිමල නාහිමි

III ප්‍රතිමා

IV සතර බ්‍රහ්ම විහරණ

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - I | |
|---|---|---|

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 11 - 4 | 21 - 4 | 31 - 2 |
| 2 - 4 | 12 - 3 | 22 - 3 | 32 - 2 |
| 3 - 3 | 13 - 2 | 23 - 1 | 33 - 1 |
| 4 - 4 | 14 - 3 | 24 - 2 | 34 - 4 |
| 5 - 4 | 15 - 1 | 25 - 3 | 35 - 3 |
| 6 - 2 | 16 - 4 | 26 - 3 | 36 - 3 |
| 7 - 1 | 17 - 4 | 27 - 3 | 37 - 2 |
| 8 - 3 | 18 - 2 | 28 - 1 | 38 - 1 |
| 9 - 2 | 19 - 1 | 29 - 1 | 39 - 1 |
| 10 - 1 | 20 - 2 | 30 - 3 | 40 - 4 |

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - II | |
|---|---|---|

## පිළිතුරු පත්‍රය

1. I ක්‍රිසාගෝතමී
   II සමථ භාවනාව" විපස්සනා භාවනාව
   III මෙය ඇතිකළ මෙය ඇතිවේ. මෙය නැතිකළ මෙය ඇති නොවේ./ මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ.
   IV ඡන්දය - කැමැත්ත
   ද්වේශය - තරහ
   භය - බිය
   මෝහය - මුලාව /මෝඩකම
   V අණන සුඛය යනු තමන් කිසි කෙනෙකුට ණය නැතැයි සිතීමෙන් ඇතිවන සතුටයි/සැපයයි
   VI සත්ත අපිරිහානි ධර්මය/අපරිහානීය ධර්ම
   VII හීටි පිළිම/හිඳි පිළිම/සැතපෙන පිළිම
   VIII අමාවතුර ගුරුළුගෝමී පඬිතුමා
   IX කළ යුතු දේ කිරීම සිරිත් -නොකළ යුතු දේ නොකිරීම විරිත්
   X කාම තණ්හා
   බව තණ්හා
   විභව තණ්හා

2. I බටහිර දිසාව- ස්වාමි භාර්යා
   උතුරු දිසාව - හිතමිතුරු ( මිත්‍ර - මිත්‍ර)
   II සැමියා බිරිඳට
   - ගරු කිරීම
   - අවමන් නොකිරීම
   - පරදාර සේවනයේ නොයෙදීම
   - ගෙදර වගකීම් පැවරීම
   - ඇඳුම් පැළඳුම් සපයා දීම

   බිරිඳ සැමියාට
   - ගේ දොර කටයුතු මැනවින් සංවිධානය කිරීම.
   - ඇසුරු කරන පිරිසට මැනවින් සංග්‍රහ කිරීම.
   - පරපුරුෂ සේවනය නොකිරීම.
   - උපයන ධනය ආරක්ෂා කිරීම.
   - සෑම කටයුත්තකම දක්ෂවීම හා අනලස්වීම.

   මිත්‍රයා
   - මිතුරාට අවශ්‍ය දේ දීම
   - ප්‍රියවචන කතා කිරීම
   - දියුණුව සඳහා කටයුතු කිරීම
   - සමානාත්මතාවය දැක්වීම
   - නොරැවටීම

   මිතුරාට
   - දුසිරිතේ වැටී ප්‍රමාද වූ මිතුර ආරක්ෂා කිරීම
   - මිතුරාගේ වස්තු ව ආරක්ෂා කිරීම.
   - බියට පත් මිතුරා ඉන් මුදවා ගැනීම.
   - විපතට පත් මිතුරා අත් නොහැරීම.
   - මිතුරාගේ අඹු දරුවන් ට සැලකීම

   III සිසුවා ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු දෙන්න

3. I නතං කම්මං කතං සාධු
   යං කත්වා අනු කප්පති
   යස්ස අස්සුමුඛෝ රෝදං
   විපාකං පටි සේවති
   II යමෙක් කිරීමෙන් පසු තැවෙන්නන්ට සිදු වේද? යම් ක්‍රියාවක විපාකය කඳුළු පිරි මුහුණින් යුතුව අඩමින් විඳින්නට සිදුවේද? එබඳු දේ නොකිරීම යහපත්ය.
   III සිසුවා ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු දෙන්න.

4. I දිට්ඨ ධම්ම වේදනීය කර්මය/මෙලොවදීම විපාක දෙන කර්මය
   උපපජ්ජ වේදනීය කර්මය/ මරණින් මතු පළමු ආත්ම භවයේදී විපාක දෙන කර්මය
   අපරාපරිය වේදනීය කර්මය/දෙවන භවයෙන් පසු ඕනෑම භවයකදී විපාක දෙන කර්මය
   අහෝසි කර්මය/ විපාක නොදී අහෝසි වී යන කර්මය

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

II අදහස මතුවන ආකාරයට කරුණු ඉදිරිපත් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

III කුසලා කුසල කර්ම පිළිබඳ අවබෝධාත්මක කරුණු ඉදිරිපත් කොට ඇත්නම් පිළිතුරු සලකා බලා ලකුණු ලබාදෙන්න

5. I ලාභ සත්කාර ආදියට ගිජු වූ අන්‍ය තීර්ථක පිරිස් මෙකල ශාසනයට ඇතුළත් වූහ. මේ නිසා සිල්වත් භික්ෂූන්ට විනය කර්ම කිරීමට නොහැකි විය. මෙම දුසිල් මහණුන් සසුනින් නෙරපීම සඳහාත් පිරිසිදු බුදු දහම ආරක්ෂා කර ගැනීම සඳහාත් මෙම ධර්ම සංගායනාව පැවැත්විය.

II දායකත්වය - ධර්මාශෝක රජතුමා / ආශෝක රජතුමා
මූලිකත්වය - මොග්ගලීපුත්ත තිස්ස තෙරුන් වහන්සේ
ස්ථානය - පැලලුප් නුවර අශෝකාරාමයේදී

III බුදුදහමේ ප්‍රතිඵලයක් ලෙස රටවල් නවයකට බුදු දහම ව්‍යාප්ත විය. කාශ්මීර"ගාන්ධාර" මහිසමහිස මණ්ඩ මණ්ඩලය වන වාසී දේශය අපරන්ත දේශය මහා රත් ප්‍රදේශය සොනත් රත් රට්ටයෙ ් හිමවත්ව ප්‍රදේශය ස්වර්ණ භූමිය තම්බපණ්නිය ධර්මදූතයන් පිටත් කර යැවීම මිහිඳු හිමියන්ගේ ලංකාගමනය පිළිබඳ විස්තර කිරීම ආදී වශයෙන් රටවල් පහක්වත් නම් කර ඇත්නම් පිළිතුරු සලකා බලා ලකුණු ලබාදෙන්න.

6. I ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්ස ් උප්පාදා ඉදං උප්පජ්ජති
ඉමස්මිං අසති ඉදං නහෝති
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති

II මෙය ඇති කල්හි මෙය වේ. මෙය හට ගැනීමෙන් මෙය හටගනී. මෙය නැති කල්හි මෙය ඇති නොවේ. මෙය නැතිවීමෙන් මේ නැතිවේ.

III සිසුවා හේතුඵල සහිතව කරුණු ඉදිරිපත් කර ඇත්නම් පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

7. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I දුක්ඛ ආර්ය සත්‍යය
දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය නම්කර කෙටියෙන් විස්තර කැර ඇත්නම් ලකුණු ලබා දෙන්න

II කළුතර දිස්ත්‍රික් කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ආසන්නයේ අදිකාරි පත්තුවේ රයිගම් කෝරළේ පිහිටා ඇති රේරුකාණ ගම

- දොන් බස්තියන්ද පවුලිස් ගුණවර්ධන සහ මුණ සිංහගේ පොඩිනෝනා මව හා පියා
- 1897 ජූලි 19 උපන් රුබෙල් ගුණවර්ධන (නම)
- වීදියගොඩ පාසලේ අධ්‍යාපනය ලැබීම.
- බුරුම ජාතික විනයාලංකාර හිමියන් යටතේ 1908 ජනවාරි 8 පැවිදි වීම.
- 1908 ජනවාරි 27 බුරුම රටට වැඩම කිරීම.
- 1917 ඔක්තෝම්බර් 26 බුරුමයේදී උපසම්පදා ලැබීම.
- පොහොය දිනය/ ධර්ම විනිශ්චය බෞද්ධයාගේ අත්පොත/ පාරමිතා ප්‍රකර්ණය/ අභිධර්ම මාර්ගය යන ග්‍රන්ථ රචනා කිරීම.
- සම්මාන පණ්ඩිත උපාධිය ලැබීම. කැලණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය පදවිය ලැබීම. 1963 සාහිත්‍ය චක්‍රවර්ති උපාධිය ලැබීම.
- අමරපුර මහා නිකායේ මහෝපාධ්‍ය ගෞරව නාමය ලැබීම. 1997 ජූලි 4 අපවත් වීම. ආදී කරුණුවලට ගැලපෙන සේ පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

III ප්‍රතිමා

- කනිෂ්ක රජුගේ කාලයේ බුද්ධ ප්‍රතිමා ආරම්භය පිළිබඳ සාධක ඇති බවත් ධාතු කරඬුවක හා කාසියක බුද්ධ රූපය දක්නට ලැබීම. ගාන්ධාර ප්‍රදේශයන් හමුවූ බවත් ග්‍රීක රෝම කලාවේ ආභාසය මේ සඳහා ලැබී ඇති බව විද්වතුන්ගේ මතයයි
- මුල් යුගයේ දී බුදුරුව වෙනුවට බෝධිය වජ්‍රාසනය" පද්මය" සිරිපතුල" ධර්ම චක්‍රය හා ස්තූප පූජනීය වස්තු ලෙෂ සලකා ඇති බව
- පිළිම වර්ග ලෙස හිඳි පිළිමය" හිටි පිළිමය" සැතපෙන පිළිම කළුගල් බදාම ඇත්දළ කිරි ගරුඩලෝහ මාධ්‍ය තුළින් නිර්මාණය කිරීම ආදිය ඇතුළත් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

IV සතර බ්‍රහ්ම විහරණ

මෛත්තා"කරුණා, මුදිතා, උපේක්ඛා නම් කර එක් එක් කරුණු පිළිබඳ කෙටියෙන් විස්තර කර ඇත්නම්ලකුණු දෙන්න

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න